

# අන්තර්ජාලයේ සිදුවන කාන්තා හිංසනය සහ නීතිය

නීතීඥ ඩී.අයි.උදානි යහම්පත් (L.L.B, Attorney-at-Law) (B.A)



# සයිබර් අපරාධ යනු කුමක්ද?

"පුද්ගලයෙකුගේ ශාරීරික, මනෝවිද්‍යාත්මක හෝ චිත්තවේගීය යහපැවැත්මට සාපරාධී හෝ සාපරාධී නොවන ලෙස පහර දෙන හෝ පහරදීමට තුඩු දියහැකි සබැඳි හැසිරීම්"




ලිංගිකත්වය පිළිබඳව හෝ යමෙකු
ලිංගිකව උද්දීපනය කිරීමේ අදහසින්
අනවශ්‍ය කෙටි පණිවුඩ යැවීම (Sexting)

# සයිබර් අපරාධ වර්ග



- **සයිබර් සහ ඔන්ලයින් හිරිහැර**
  Trolling, Phishing, hate speech etc.

- **සමීප රූප සම්මුතියකින් තොරව බෙදා ගැනීම**
  පළිගැනීමට, නින්දා අපහාස කිරීමට, සූරාකෑමට ඡායාරූප, වීඩියෝ පට බෙදා ගැනීම

- **ලිංගික අතවර වාර්තා කිරීම බෙදා හැරීම**
  ලිංගික අතවර වල වීඩියෝ සහ පින්තූර සමාජ මාධ්‍ය හරහා බෙදා ගැනීම

- **සයිබර් ලුහුබැඳීම (Stalking) ඩිජිටල් ආදර සම්බන්ධතා හරහා සිදුවන අයෝජනය**
  හිරිහැර කිරීම තර්ජනය කිරීම සහ අන්තර්ජාලය හරහා හවුල්කරු පාලනය කිරීම - GPS දුරකතන ලුහුබැඳීමේ යෙදවුම් තුලින් කාන්තාවගේ සෑම පියවරක්ම නිරීක්ෂණය

# හිරිහැරයට ලක්වූ කාන්තාවන් කළයුත්තේ කුමක්ද?



- සාක්ෂි කිසිවක් නොමකා ඒවායේ සබැඳිය (Link) ගබඩා (Save) කරගන්න
- නිවැරදි තාක්ෂණික මගපෙන්වීම හා උපදෙස් සඳහා අමතන්න **හිතවතී - 0114216062**
- 0112326979/ 0112320141 අමතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාශය (සයිබර් අංශය) හා සම්බන්ධ වන්න
- වින්දිතයා අවුරුදු 18ට අඩු පුද්ගලයෙකු නම් 1929 ඔස්සේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා සම්බන්ධ වන්න
- වින්දිතයා අවුරුදු 18ට වැඩි අයෙකු නම් 1938 අමතා අදාල උපදෙස් ලබාගත හැකිය
- එසේම නීතිමය විග්‍රහයක් හෝ ඒ සමාන සහායක් අවශ්‍ය වේ නම් 0114718585 ඔස්සේ කාන්තා පිහිට ආයතනය (WIN) සමග සම්බන්ධ විය හැකිය

# සයිබර් අවකාශයේ ඔබ ආරක්ෂා වන්නේ කෙසේද?



- සමාජ මාධ්‍යයක් භාවිතා කිරීමේදී එහි ක්‍රියාකාරීත්වය ප්‍රථමයෙන් අධ්‍යනය කිරීම
- අතිශය පෞද්ගලික තොරතුරු සමාජ මාධ්‍ය වල හුවමාරු කරගැනීම සීමා කිරීම
- සමාජ මාධ්‍ය ජාලා මඟින් හදුනා ගන්නා පුද්ගලයන් සමඟ ප්‍රේම සම්බන්ධතා ඇරඹීමේදී කල්පනාකාරී වීම
- ආරක්ෂාව සඳහා වූ තාක්ෂණික උපක්‍රමයන් භාවිතා කරමින් එම ගිණුම්වල මුරපද (Password) නිතර වෙනස් කිරීම
- තමන් නොදන්නා පුද්ගලයන්ගෙන් එන පණිවිඩ සඳහා එකවර ප්‍රතිචාර නොදැක්වීම
- ව්‍යාජ ඉලෙක්ට්‍රොනික ලිපිවලින් ප්‍රවේසම් වීම

# සයිබර් අපරාධ සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීතිමය ප්‍රතිපාදන



- 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත
- දණ්ඩ නීති සංග්‍රහයට අනුව 286A, 286B, 286C වගන්ති අනුව දරුවන් හා සම්බන්ධ අසභ්‍ය දර්ශන පළකිරීම හා ප්‍රදර්ශනය
- 1983 අංක 22 දරණ සංශෝධනය සහිත 1927 අංක 04 දරණ අසභ්‍ය දර්ශන පනත අනුව අසභ්‍ය දර්ශන සම්බන්ධ ක්‍රියාවන් සිදුකිරීම හෝ ඒවාට අනුබල දීම (Obscene Publications Act)
- දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය අනුව ලිංගික ආකාරයක් ගන්නා හිරිහැර පහරදීම්, සපරාධී බලකිරීම්, සපරාධී කතාව හෝ ක්‍රියාව සිදුකිරීම, 372 වගන්තිය අනුව අසාධාරණ ලෙස මුදල් ලබා ගැනීම (Penal Code)
- සාක්ෂි විශේෂ විධිවිධාන පනත<br>Evidence (Special Provisions) Act No. 14 of 1994
- බුද්ධිමය දේපල පනත - Intellectual Property Act No.36 of 2003
- ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - Electronic Transactions Act No.36 of 2003



# ස්තූතියි

නීතීඥ ඩී.අයි.උදානි යහම්පත් (L.L.B, Attorney-at-Law) (B.A)